# 21වන සියවසේ ශ්‍රී ලකාවේ බෞද්ධ සංස්කෘතියේ නව ප්‍රවණතා

එච්.එම්.ඩී.ආර්. හේරත්

නිත්‍ය නො වන ලෝක ස්වභාවය පිළිබඳ ව අතිවිශිෂ්ට විග්‍රහය ඉගැන්වෙන්නේ බුදු දහමෙන් පමණි.

"ලොව සියල්ල අනිත්‍ය ධර්මයට යටත්වේ. එහෙයින් ලොව කිසිදු අනුභූතියකින් ස්ථිර සුවයක් පැතිය නො හැකි ය. අනිත්‍ය ලක්ෂණයන් යුක්ත හෙයින් අනාත්ම වූ සියල්ල දුකෙහි ඇතුළත් වේ. ප්‍රධාන හේතූන් කිහිපයක් නිසා දුක හට ගනී. ප්‍රධාන හේතූන් නැති කිරීමෙන් දුක නැති කළ හැකි ය. දුක නිවා දැමීම නිවනයි. ඒ සඳහා අනුගමනය කළ යුතු ඍජු මාර්ගයක් තිබේ. එම මාර්ගය නම් මධ්‍යම ප්‍රතිපදාවයි." **(සිරිධම්ම හිමි, 2012:2).**

බුදුන් වහන්සේ විසින් දේශිත ධර්මය, ආචාර්ය පූජ්‍ය ලබුදූවේ සිරිධම්ම හිමියන් සැපයූ ශාස්ත්‍රීය ලිපියක වඩාත් සංක්ෂිප්ත ලෙස මෙසේ සටහන්කොට තිබූ අතර මෙම ලිපියේ ආරම්භයට එය යොදාගත්තේ මහින්දාගමනයෙන් ආරම්භ වූ ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය 21 වන සියවස වන විට පත් ව ඇති අනිත්‍ය ස්වභාවය පැහැදිලි කිරීමට ය. මෙම ලිපියේ අරමුණ වන්නේ ද මෙම සංස්කෘතිය වෙනස්වීම පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කිරීම ය. 20 සියවසේ තායිලන්තයේ සහ ශ්‍රී ලංකාවේ බුදු සසුන පිළිබඳ අධ්‍යයනයක් සිදු කළ මහාචාර්ය තම්බයියා පසුගිය වසර 600ක පමණ කාලසීමාව තුළ භික්ෂූන් වහන්සේලා පරිහරණය කරනු ලබන චීවරයේ පවා වෙනසක් සිදු වී නොමැති බව සඳහන් කරයි. (Tambia) එහෙත් පසුගිය වසර 40 පමණ තුළ විවෘත ආර්ථිකය හඳුන්වා දුන් නව නාගරික සංස්කෘතිය විසින් ඇති කළ වෙනස්කම් බෞද්ධ සංස්කෘතියේ වෙනසක්කම්වලට ද බලපෑ අතර මෙයට විවෘත ආර්ථිකයේ මධ්‍ය සංස්කෘතිය ද බෙහෙවින් බලපා තිබේ.

ග්‍රාමීය පන්සල කේන්ද්‍රකර ගත් සංස්කෘතිකාංගය වෙනුවට එක් කේන්ද්‍රයකින් ආරම්භව රටපුරා පිහිට වූ මහමෙව්නා සංස්කෘතිය අනුරාධපුර යුගයේ සිට ම ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ ජනතාවගේ එදිනෙදා චර්යාවන් ඍජු ලෙස සම්බන්ධ වී තිබුණේ ග්‍රාමීය පන්සල සමග ය. පන්සල යන්න පණ්ණසාල යන්නනෙන් බිඳී ආ ශ්‍රී ලංකාවටම පමණක් සීමා වූ ග්‍රාමීය බෞද්ධ ආගමික කේන්ද්‍රය විය. එය ග්‍රාමීය ආර්ථික කේන්ද්‍රස්ථානය වූවා පමණක් නො ව ගැමියාගේ ආර්ථික, සාමාජීය

සංස්කෘතික හා දේශපාලන කේන්ද්‍රස්ථානය ද විය. කර්මය හා ධර්මය මගින් සමාජ පැවැත්මට බොහෝ දේවල් ගැමියෝ පන්සල මගින් ඉගෙන ගත්හ. පන්සල ග්‍රාමීය සමාජයේ මූලස්ථානය විය. "ස්වස්ති සිද්ධම් අයනු ආයනු" යනුවෙන් ගැමි දරුවන් වැලිපිල්ලේ අකුරු ලියා ආරම්භ වූ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පන්සල යි. කුඩා දරුවන් ඇකයේ හොවාගෙන පෝදාට පන්සලට පියනගන මව්වරු මෙන් ම පියවරු විහාර මන්දිරයේ ඇඳ ඇති චිත්‍ර මගින් ළමා පෞරුෂ වර්ධනයට අදාළ බොහෝ දේ විස්තර කර දුන්හ. වෙස්සන්තර ජාතකය, ධර්මපාල ජාතකය සුතසෝම ජාතකය ආදි බොහෝ ජාතක කතාවන් මෙන් ම බුද්ධ චරිතය ඉතාමත් සෝභමාන අන්දමින් විහාර මන්දිරයේ ඇඳ ඇත්තේ මනා චරිත සංවර්ධනයකට අවශ්‍ය පදනමක් වශයෙනි.

වර්ෂය පුරා ම පන්සල් භූමිය හා ගොදුරු ගම්මානවල මිනිසුන්ගේ පන්සලට බැඳුණු වගකීම් සම්භාරයක් විය. සෑම මාසයක ම පෝය හතරට සිල්ගත් ගැමි උපාසක උපාසිකාවන් දාන, ශීල, භාවනාවල නියුක්ත අතර පන්සලේ භික්ෂූන් වහන්සේලා දායක දායිකාවන්ගේ උපත, වැඩිවිය පත් වීම, විවාහය හා මරණය යන ජීවන චක්‍ර උත්සවවල ආගමික කාර්යන් මහත් ඕනෑකමින් ඉටු කළහ. දුරුතු මාසයෙන් ආරම්භ වන බොහෝ ආගමික උත්සව අතර සූවිසි විවරණ, සත්සති ධර්මදේශනා, මිලින්ද ප්‍රශ්නය, වස් ආරාධනා පිංකම්, කඨින පිංකම්, ආසන දෙකේ බන මෙන් ම පන්තේරු, වෙස් නැටුම් මෙන් ම විරිදු බණ ද සජ්ඣායනා විය.

උදයේ සිට සවස් කාලය වන තුරු ම කුඹුරු පිටිවල වෙසෙන ගැමියන් සවස් මානයේ පන්සලේ බණ මඩුවට එක්රොක් වූ විට ඔවුන්ට මානසික සන්තුෂ්ටිය මෙන්න සදාචාරාත්මක පවුල් ජීවිතයකට අදාළ බොහෝ දේවල්වලට අදාළ " සඳකිඳුරු ජාතකය" රඟ දැක්වීම, "ධර්මපාල ජාතකය" වැනි කතා රඟ දැක්වීමෙන් ඉගෙන ගත්හ. ඔවුන් තම තමන්ගේ දූ දරුවන්ගේ ජන ජීවිතයට අදාළ බොහෝ දේ පන්සල කේන්ද්‍රකරගත් ජන සංස්කෘතියෙන් ඉගැන්වූහ. එ පමණක් නො ව සංඝයාවහන්සේ රජුන් උදෙසා ද අවවාද අනුශාසනා කළහ.

"සංඝයා වහන්සේ හැම පෝය දිනයක දී ම අනුරාධපුර, පොළොන්නරු හා දඹදෙණි යුගයන්හි විසූ රජ දරුවන් කරන ලද ශ්‍රේෂ්ඨ ක්‍රියා ගෙනහැර පාමින් ඔවුන් විසින් මහජනාභිවෘද්ධිය සඳහා කරන ලද ආශ්චර්යඅද්භූත වාරිමාර්ග ගැනත් තනවන ලද විහාර, දාගැබ්, රෝහල්, වෙළඳපලවල් හා වන්දනා මාර්ග ගැනත් කරුණු පහදා දී රජුට අනුශාසනා කළ සේක. එහෙත් තම රාජ්‍යය විදේශීය සහ්‍යත්වයක් හිසින් ගත් විදේශිකයන් විසින් වටකොටගෙන සිටින තාක් මාර්ග තැනීම වැනි කටයුතුවලට අත නොගසන ලෙස උන් වහන්සේ රජුට අවධාරණයෙන් අවවාද කළ සේක **(විමලානන්ද, 1966: ixvi)**.

මෙයින් පැහැදිලි වන්නේ මහනුවර යුගයේ දී පවා මහා සංඝරත්නය කෙතරම් තීරණාත්මක ලෙස රජුට බලපෑවේ ද යන්න යි.

මහා විහාර සම්ප්‍රදායෙන් ඇරඹි මෙම පන්සල් සංස්කෘතිය ජන ජීවිතයේ සෑම අංශයක් ම අතික්‍රමණය කරමින් බොහෝ ලෞකික දේවල් කරා ද යොමු වූයේ ය.

විශේෂයෙන් මිනිසුන් සුවපත් කිරීම සඳහා නිර්මාණය වූ දේශීය වෛද්‍ය සම්ප්‍රදාය මහා සංඝරත්නය පන්සල කේන්ද්‍ර කරගෙන ඉදිරියට ගෙනඑනු ලැබිණි. මේ නිසා පන්සල ආශ්‍රය කොටගෙන බෙහෙත් උයන් නිර්මාණය විය. සියලු ම ආකාරයේ වෙදකම් පන්සල ආශ්‍රිත ව සිදු වූ අතර ගිහිජනතාවගේ රෝග නිර්වාණය සඳහා කළ යුතු වූ සියලු දේවල් පන්සල මගින් සිදු විය. මේ සමඟ දේශීය වෛද්‍ය විද්‍යාවේ අංගයක් ලෙස යන්ත්‍ර, මන්ත්‍ර, තන්ත්‍ර යන ත්‍රිවිධ අංශය භික්ෂූන් වහන්සේලා ප්‍රගුණ කළ අතර නක්ෂත්‍රය ද මෙහි අත්‍යවශ්‍ය අංගයක් ලෙස සංවර්ධනය වූයේ ය. සීතාවක යුගයේ විශාල වශයෙන් ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණික ශිව භක්තික යන්ත්‍ර මන්ත්‍ර කරුවන්ගෙන් දේශීය වෛද්‍ය සංස්කෘතිය බේරාගැනීම සඳහා මහා සංඝරත්නය දැඩි උනන්දුවකින් හා කැපවීමකින් ද ක්‍රියාකළ අතර විශේෂයෙන් සීතාවක යුගයේ දී ගණින්නාන්සේලා විසින් මෙම ලෞකික විෂයන් වඩාත් වර්ධනය කළ බව පෙනේ.

මේ හැර පන්සල විසින් තමන්ගේ ගොදුරුගමේ සදාචාර චර්යා පාලනය කිරීම සිදු කළ අතර විශේෂයෙන් අපචාරී චර්යාවන්ගෙන් ජනතාව මුදවාගෙන ක්‍රියා කිරීම අනිවාර්යයෙන් ම සිදුකරන ලදි. ගොදුරු ගමේ සිදු වූ හොර මැරකම්, සුළු සුළු අපරාධ සියල්ල නවත්වා දමා විනය ආරක්ෂා කිරීම පන්සලේ මහා සංඝරත්නයේ වගකීම විය. රජු අණසක මගින් ක්‍රියාත්මක වූ කටුපුල්ලේ රාලවරුන්ගේ සේවය ලබාගැනීම පන්සලට නිගරුවක් වූ හෙයින් බොහෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු පන්සල මගින් සිදු විය. ඉංග්‍රීසින්ගේ පාලන යුගයෙ දී පවා පොලිස් ස්ථානවලට ගොදුරු ගම්වල වරදකරුවන් යැවීම නවත්වා දැමීමටත් යෝග්‍ය සරල දඬුවම් දීමක් මගින් තමන්ගේ ගම්මානවල වැසියන්ගේ නෛතික කටයුතුවල මූලස්ථානය වූයේ ද පන්සල යි.

මේ හැර ජාතික සංස්කෘතියේ කේන්ද්‍රය වූයේ ද පන්සල යි. සියලු ම දේශීය සංගීත (ආතත, විතත, විතාතත, ඝන, සුෂිර) භාණ්ඩවලින් නිර්මාණය වූ පංචතූර්ය නාදය මෙන් ම දේශීය නැටුම් සම්ප්‍රදායන් සියල්ලට අදාළ ගුරුකුල පන්සල ආශ්‍රයෙන් නිර්මාණය විය. මේ නිසා කලාව ප්‍රගුණ කිරීමේ ප්‍රධාන ස්ථානය වූයේ ද පන්සල යි.

මේ හැර මෙම පන්සල් අධ්‍යාපනය ප්‍රශස්ත අන්දමින් ඉටු කිරීම සඳහා රටේ විවිධ ප්‍රදේශවල ඇති වූ අටමුල ආයතන මගින් භික්ෂූන් වහන්සේලා පුහුණු කළ අතර අවම වශයෙන් විෂයයන් 54ක් පමණ මේවායේ ඉගැන්වූහ. භාෂාව ව්‍යාකරණ, කාව්‍ය, ඡන්දස්, අලංකාර, නාට්‍ය, ජ්‍යෝතිෂය, වෙදකම, ගණිතය, භෞතික විද්‍යාව, දර්ශනය **(බලගල්ලේ, 1995 : 445).**

පන්සල අනිවාර්යයෙන් ම බැඳුණු රාජකාරි ක්‍රමය මගින් ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍යයට අනුව සැපයෙන සේවාවක සංස්ථාගත ආයතනික රටාවක් නඩත්තු කරනු ලැබී ය. මේ නිසා සිංහල බෞද්ධයෝ පන්සල හා බැඳී සිටියේ ය. මේ නිසා පන්සල නැමැති බහුකාර්ය ආයතනයෙන් අතිසුවිසල් සමාජ කාර්යභාරයක් ඉටු කෙරිණ. මෙම සමාජයේ සිටි මිනිසුන් බොහෝ දෙනෙක් යැපුම් ආර්ථිකයක කොටස්කරුවෝ වූහ.

එහෙත් 1970 දශකයේ අග භාගයෙන් ඇරඹෙන නව ලිබරල් ආර්ථික ක්‍රමය සමඟ ම ග්‍රාමීය සමාජයේ මිනිසුන් නව නාගරික ප්‍රවාහයකට හසු වූ භූගෝලීය චලනතාවයක් මගින් නගරවලට පිවිසුණහ. මේ අයගේ සිතුම් පැතුම් හා චර්යාවන්ට අවශ්‍ය නාගරික අසපු (ආරාම සංස්කෘතියක්) 20 වන සියවසේ අගභාගය වනවිට වර්ධනය වෙමින් පැවතියේ ය. මෙය මහමෙව්නා අසපුව කේන්ද්‍ර කරගත් නව බෞද්ධාගමික සම්ප්‍රදායක් විය. මෙම අසපු සම්ප්‍රදාය එක් අනුහස් නායක (charismatic Leadership) භික්ෂූන් වහන්සේ කෙනෙකුගෙන් ආරම්භ වී ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල භාවනාව පෙරටුකොට ඒකීය භාවනා සංස්කෘතියක් මෙ මගින් නිර්මාණය වූ අතර බොහෝ කාලයක් තිස්සේ ග්‍රාමීය සමාජයේ ව්‍යුහාත්මක ලක්ෂණයන් සමඟ අනුගත වූ පන්සල පෙරටු කොටගත් සංස්කෘතියට මේ නව සංස්කෘතිය අභියෝගයක් වූයේ ය.

සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජයේ පන්සල බහුකාර්ය ආයතනයක් විය. එහි භාවනාව යන්න එක් සුවිශේෂී අංගයක් වූ අතර අනෙක් බොහෝ අංගයන් මගින් බහුවිධ කාර්යන් ඉටු කරනු ලැබිණි. උදාහරණයක් වශයෙන් ගමේ ගොවියෙකු තමන්ගේ කුඹුරට බිත්තර වී ටිකක් නොමැතිව අසරණ ව සිටින විට ඔහු වහා ම පන්සලේ උපකාරය ලබා ගත්තේ ය. පන්සලේ වී බිස්සෙන් දායකයාගේ අවශ්‍යතාව වහා ඉටු විය. හේතුව දායකයාට පිහිටවීම ගමේ පන්සලේ කාර්යභාරය වීම යි. එය අවුරුදු දහස් ගණනක් පන්සල පෝෂණය කිරීමට දායක වූ ජාන සම්ප්‍රදායකට උදව්වීම යි.

## නව මහමෙව්නා සංස්කෘතිය සහ ව්‍යාප්තිවාදය

නව මහමෙව්නා බෞද්ධ සංස්කෘතිය සාම්ප්‍රදායික මහාවිහාර සංස්කෘතියෙන් බැහැර වූ පන්සලෙන් වියුක්ත වූ අසපු සංස්කෘතියක් විය. පන්සල යන්න මිහින්තලයෙන් ආරම්භ වූ භික්ෂූන් වසන කුඩා ගෙය විය. පන්සල් (කොළ සෙවූ කුඩා ගෙය) **(සෝරත හිමි, 20553)**. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාවර වීමත් සමඟ දහස් ගණනින් මිනිසුන් මහණ දම් පිරීම හේතුකොට ගෙන වැඩිවන භික්ෂු සංඝයාවහන්සේට හදිසියේ ගොඩනැංවූ කොළ අතු සෙවිලි කළ කුඩා ගෙවල් පණ්ණසාල (පන්සල්) නිර්මාණය වන්නට විය. ඒවා පසු කාලීන ව පන්සල් හෙවත් සංඝාවාස වශයෙන් භාවිතයට පැමිණ අද දක්වා ම සිංහල සංස්කෘතියේ කේන්ද්‍රස්ථාන බවට පත් විය.

එහෙත් අසපු ආරාම ඉහතින් සඳහන් කළ ආකාරයේ ඒවා නො වේ. ඒවා මහා සංඝයා වැඩවසන විශාල සංඝාරාමයන් ය. මහමෙව්නා සංස්කෘතියේ සියලු ආරාමවල දක්නට ලැබෙන්නේ එක ම ආකෘතියකි. බුදුන් වහන්සේලා වැඩ සිටින මාළිගා, චිත්‍ර, බුද්ධ රූපවල ස්වරූපය, කැටයම්, වහල මේ සියල්ල ම පොදු ලක්ෂණවලින් සමන්විත ය. ලංකාවේ කොහේ තිබුණත් මහමෙව්නා සංස්කෘතිය ඒකීය වූයේ ය. එය එක් ස්ථානයකින් ආරම්භ වී එහි ව්‍යාප්තියක් ලෙස සමරූපී ලක්ෂණවලින් යුක්ත වූයේ ය. මෙහි වන්දනා කරන රටාව වෙනස් විය. නිශ්චිත කාලසටහනකට අනුව භාවනා

වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර නිර්වාණගාමී ප්‍රතිපදාව පමණක් මෙහි ප්‍රගුණ කළේ ය. ඊට අමතර ව මුද්‍රිත පොත්, කැසට්, පත්‍රිකා ආදි සියල්ල භාවනාකරුවන්ට නො අඩුව ලැබුණේ ය.

## ග්‍රාමීය සමාජ ව්‍යුහයෙන් වියුක්ත නව චල්‍යතා සංස්කෘතිය

ශ්‍රී ලංකාවේ ග්‍රාමිය සංස්කෘතියේ සහ තිරස් යන අංශ දෙක ම යාකරමින් සමාජ ව්‍යුහය ගොඩනැංවී ඇත. එනම් පියා, පියාගේ පියා, පියාගෙත් පියා වශයෙන් සිරස් සංස්කෘතිකයක සාමාජිකයෝ ගමේ පන්සලේ දායකයෝ වූහ. අනිත් අතට තිරස් සමාජ ව්‍යුහය ගතහොත් න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල, අසල්වාසි සමූහය මේ සියලු දෙනා ම වසර සිය ගණනක සිට පන්සලේ දායකයෝ වූහ. පන්සල ගොඩනැඟීමට පුරෝගාමී වූ ආදි පරම්පරාවක මියගිය දායකයාගේ සිට නූතන පරම්පරාවේ සජීවී දායකයා දක්වා මේ සියලු දෙනා ම එක ම සංස්කෘතියක කොටස් ලෙස පන්සලේ පැවැත්මත්, දායකයාගේ පැවැත්මත් සමඟ සහජීවන සංස්කෘතියක් මෙහි තිබුණේ ය. පන්සලේ හදිසියක් වූ වහා ම සණ්ඨාව නාද කළ වහා ම ගම්මු පන්සලට වහ වහා පැමිණියහ. පන්සලේ අවශ්‍යතා මැනවින් ඉටු කළහ.

එහෙත් අසපු සංස්කෘතිය එවැන්නක් නො වේ. බොහෝවිට බාහිර පුද්ගලයන්ගේ මැදිහත්වීමෙන් හෝ පරිත්‍යාගයෙන් ලැබෙන ඉඩමක ගොඩනැංවෙන අසපුව මධ්‍යම පාන්තික ප්‍රභූවරුන්ගේ හෝ පරිත්‍යාගශීලීන්ගේ මැදිහත්වීමෙන් චෛත්‍යය කේන්ද්‍ර කොටගෙන ඉදි වේ. මෙම භාවනා මධ්‍යස්ථානවලට පැමිණෙන බොහෝ උපාසක උපාසිකාවන් විවිධ ප්‍රදේශවලින් සමීප වන්නේ ය. ඔවුන් බොහෝවිට රැකියාවලින් විශ්‍රාම ගිය අය හෝ තරුණ ජනයා වූහ. ඔවුන්ගේ ඒකායන බලාපොරොත්තුව පුද්ගල විමුක්තිය සඳහා පමණක් වන භාවනානුයෝගි සම්බන්ධතා රටාව යි. මේ අනුව මෙම අසපුවලට පැමිණෙන භූගෝලීය චල්‍යතා සංස්කෘතියක කොටස්කරුවෝ වෙති.

## අසපු සංස්කෘතියේ භෞතික නිර්මාණයන් සහ මූල්‍ය පරිපාලනය

මහමෙව්නා භාවනා අසපු සංස්කෘතියේ බොහෝ භෞතික නිර්මාණ ගිහිභවතුන්ගේ මැදිහත්වීමෙන් සිදු වේ. අසපුවේ විවිධ අංග, අලුත් නිර්මාණ, ගොඩනැගිලි, පරිශ්‍රය මේ ආදි සෑම භෞතික නිර්මාණයක් ම ගොඩනැංවීමට දායක වන්නේ ගිහි මණ්ඩලයකිනි. මූල්‍ය ප්‍රතිපාදනය, සම්පාදනය, කළමනාකරණය, යෙදවුම් ආදි දේවල් තීරණය කරන්නේ මෙම ගිහියන්ගේ මණ්ඩලය මගින් ය. ස්වාමීන් වහන්සේලා මුදල් ඇල්ලීම හෝ ගනුදෙනු ආදියෙහි නියුක්තවන්නේ නැත. එහෙත් ප්‍රධාන ස්වාමීන් වහන්සේ සියලු ම මාධ්‍ය සැලසුම්කරණයෙහි නියුක්ත වී අවසාන නිගමනයෙහි යෙදෙනවා විය හැකි ය.

සාම්ප්‍රදායික පන්සල් සංස්කෘතියෙහි විවිධ ගොදුරු ගම්මානවලින් පැමිණෙන පිංවතුන් සඳහා වෙන් වූ බණමඩු පියස්සවල් දක්නට ලැබෙන අතර ඒවා ඔවුන්ගේ සාම්ප්‍රදායික උරුමයේ කොටසක් වූහ. නමුත් අසපු භාවනා සංස්කෘතිය තුළ විශේෂයෙන් නාගරික ප්‍රභූන්ගේ දායකත්වයෙන් ඉදිවෙන සදහම් මණ්ඩපය, ධාතු

මන්දිරය, චෛත්‍යය ආදි සියල්ල මහමෙව්නා භාවනා උපසංස්කෘතියේ කොටස් වෙති. එපමණක් ද නො ව ඒවාට නිශ්චිත හැඩයක් තිබෙන අතර එම හැඩය මහමෙව්නා භාවනා සංස්කෘතියේ ම අංගයෝ වෙති. මෙහි ඉදිවන පිළිම වහන්සේලා ඒවාට ආවේණික රූරටාවලින් යුක්ත ය. මෙහි නෙළන ලද පිළිමවල නව්‍යමය ස්වරූපය පිළිබඳ ව අසපුව හා ගිහි මණ්ඩල සාමාජිකයකුගෙන් විමසූ විට ඔහු පැවසූවේ

''මෙම බුද්ධ රූප ශ්‍රී ලංකාවේ බුදු පිළිම කලාවේ විකාශනයේ එක් අවස්ථාවක් නිරූපණය කරන බව යි''

එමෙන් ම නිර්මාණකරණය සඳහා දායකත්වය මුදල්වලින්, පිත්තල පූජා කිරීමෙන් ද, රිදී පූජා කිරීමෙන් ද, රන් පූජා කිරීමෙන් ද, ආදි ඕනෑම ක්‍රමයකට දායක විය හැකි ය. මේ සියල්ල ම සාම්ප්‍රදායික රටාවෙන් වෙනස් වූ නව දායකත්ව රටාවක් ගොඩනැංවෙන භාවනා සංස්කෘතියේ සංරචකයෝ වෙති.

## තරුණ පෙළ සඳහා අවධාරණය කෙරෙන මහමෙව්නා බණ සංස්කෘතිය

මහමෙව්නා උපසංස්කෘතියේ ඩැඩි වශයෙන් සම්බන්ධතා පවත්වන්නේ නාගරික මෙන් ම ග්‍රාමීය තරුණ තරුණියන් ය. විශේෂයෙන් පසුගිය කාල සීමාව තුළ තරුණ තරුණියන්ගේ මනසට ගෝචර වන පරිදි බුදු දහම විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදයක් මහමෙව්නා භාවනා සංස්කෘතිය තුළ දක්නට ලැබේ. අතිශය ආකර්ශනීය ලෙස කෙරෙන ධර්ම විශ්ලේෂණයක් තරුණ තරුණියන්ගේ සිත් සතන් පිනායන පරිදි විග්‍රහ කරන බුද්ධි ගෝචර දහම් මාර්ග විවරණයක් හේතුකොට ගෙන විශ්වවිද්‍යාලය තරුණ තරුණියන් මෙන් ම උසස් පෙළ හදාරණ තරුණ තරුණියන් ද මහමෙව්නා සංස්කෘතියට ආකර්ෂණයක් දක්වති. විශේෂයෙන් සම්ප්‍රදායික පන්සල්වලට වඩා වෙනස් වූ චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාත්මක වන ආකාරයක් මෙම අසපු සංස්කෘතිය තුළ දක්නට ලැබේ.

බුද්ධභාෂිතයේ පාලි ගාථා සිංහලට පරිවර්තනය කොට සජ්ඣායනා කරනු ලබන අතර බොහෝ පිරිත් සජ්ඣායනයන් සිංහල භාෂාවෙන් කරනු දක්නට ලැබීම මෙහි විශේෂ ලක්ෂණයකි. එකම වයස් කණ්ඩායම්වල තරුණ භික්ෂූන් වහන්සේලා ස්වකීය දායක දායිකාවන් සමඟ වන්දනා ගමන් යමින් අනුරාධපුර අටමස්ථානය, කැලණිය, දළදා මන්දිරය ආදි නොයෙක් ස්ථානවල සැරිසරන අතර එම වන්දනා කණ්ඩායම් තුළ මහත් විනයක් සහ ශික්ෂණයක් දක්නට ලැබේ.

2004 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිංහල අවුරුදු දිනයේ දී නාවලපිටියේ මගේ මිත්‍රයකුගෙන් අවුරුදු චාරිත්‍ර පිළිබඳ ව විමසන විට දී ඔහු පැවසුවේ ''අපි චාරිත්‍ර වාරිත්‍ර නො පිළිගන්නා බවත් ඒවා හිස් දේවල් බවත් මගේ දියණිය මහනුවර උසස් විද්‍යාලයක උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් හදාරමින් සිට අවසාන වර්ෂයේ මහමෙව්නා අසපුවෙන් බණ අසා සසර කලකිරී අධ්‍යාපනය නවත්වා බණ දහම්වල නියැළෙමින් සිටින බවත්, ඇය ඇසූ බණවලට අනුව අවුරුදු චාරිත්‍ර වැනි දෑ නිශ්ඵල දේවල් බවත් ඒවා මගින් නිර්වාණය ප්‍රමාද කරන බවත් පැවසීය.''

මෙය ඇසූ විට ජාතික සංස්කෘතියේ අංගයක් වූ සිංහල අවුරුදු චාරිත්‍ර නො පැවැත්වීම පිළිබඳ ව සිතෙහි කිසියම් කුකුසක් ඇති වුව ද ඒ පිළිබඳ ව තව දුරටත් නො විමසා සිටීමට වග බලා ගත්තෙමි.

ඉහත සඳහන් සරල තොරතුරු සමුච්චියෙන් පැහැදිලි වන්නේ 21 සියවසේ නාගරික සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගත් නව්‍යමය වූ මහමෙව්නා අසපු භාවනා සංස්කෘතිය ශ්‍රී ලංකාවේ ජනතාවගේ සිත් සතන් තුළ නිශ්චිත සහ පැහැදිලි වෙනසක් සිදු කරමින් තිබෙන අතර එයට බෙහෙවින් ම ගෝචර වන පරිදි රූපවාහිනි මාධ්‍යය සංස්කෘතියක් ද ගොඩනැංවී ඇති බව යි.

## ''කිරිපිරි බුරුළු තිබියදී අඟගෙන කිරි දෝ නාසේ'' මීවනපලානේ ප්‍රමුඛ කරගත් උපසංස්කෘතිය

ඉහත සඳහන් උපමාව මගින් බෝධිවංශකරුවා උත්සාහයට ගත් කිරි ලබා ගැනීමට යෝග්‍ය එළදෙනුන්ගේ කිරි බුරුළු තිබිය දී අඟ ගෙන කිරි දෙවීමට තරම් මෝඩ ජනතාව ලෝකයේ සිටින බව ඇඟවීම යි. මෙ වැනි ම දෙයක් ලෝකයේ බුදුන් වහන්සේ පහළ වී වසර 2568කට පසු ශ්‍රී ලංකාවේ ඇති වී ඇතිසෙයක් එ නම් ලෝකෝත්තර සත්‍ය ගවේෂණයේ යෙදුණ බුදුන් වහන්සේ සත්‍ය කුමක්දැයි ලෝකයට පහදා දුන් සේක. එම සත්‍යවාදි ධර්මය පිහිට කොට නො ගෙන ධර්මය කියාදුන් බුදුන් වහන්සේගේ උපත, බුද්ධත්වය හා පරිනිර්වාණය පිළිබඳ ශ්‍රී ලංකාව පදනම් කොටගත් ස්ථාන නියම කර ගනිමින් තමතමන්ගේ ආත්මීය කුල ඔසවා තබමින්, නූතන භූ භෞතික සාක්ෂි, භූ පුරාවිද්‍යාත්මක සාක්ෂි සහ ලේඛනගත සාක්ෂි ඉවත දමමින් අශීලාචාර NGO සංස්කෘතියේ පිහිට ලබන මීවනපලානේ ප්‍රමුඛ උපසංස්කෘතියක් ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට අභියෝග එල්ල කරමින් සිටී. එ මෙන් ම 1970න් පසු ඉතිහාස විෂය නූතන ඉංජිනේරුවෝ කිහිප දෙනෙකු සහ දොස්තරවරු කිහිප දෙනෙක් බටහිර NGO නඩය සමඟ මෙම උපසංස්කෘතිය ඇදගෙන යති.

මීවනපලානගේ ව්‍යාජ මිත්‍යාවක් විසින් මෙහෙයවන සමස්ත චින්තනය ම සිංහල බෞද්ධයන්ට හා ඉතිහාසය ගොඩනැගූ ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකික භික්ෂු පරපුර මෙන් ම පසු කාලීන ඉතිහාසඥයන් සියලු දෙනා ම නින්දාවට පත් කරන්නේ ය. ඔහු මෙසේ පවසයි.

''එවකට මගධ රට රජ වූ රජගහනුවර රජ කළ බිම්බිසාර රජුගේ පුතු වූ අජාසත්ත රජු මේ සඳහා යම් රාජ්‍ය අනුග්‍රහයන් දැක්වීය. ඔහු සකස් කර දුන් ඒ සප්තපර්ණි ගුහාව අදටත් අම්පාර රජගල පුරාවිද්‍යා නටබුන් අතරේ දැකගත හැකි ය. පළමුවන ධම්ම සංගායනාව හා ඒ පිළිබඳ ව විග්‍රහ කළ සියලු විස්තරයන් මහාවංශයේ මුල් පරිච්ඡේදවල පැහැදිලි වෙයි. මහාවංශයේ මෙන් ම දීප වංශයේත් මේ බව සඳහන් කර ඇත.'' **(සිරිධම්මාලංකාර, 2018:39).**

මානසික රෝගියකු වන මීවනපලාන, අවම වශයෙන් මහාවංශය නමැති ශ්‍රේෂ්ඨ ඉතිහාස ග්‍රන්ථයවත් කියවා නැත. මහාවංශයේ කුමන මුල් පරිච්ඡේදයේ,

කීවෙනි පිටුවේ මෙවැන්නක් සඳහන් වේ ද? යන්න පැහැදිලි කිරීමට ඔහුට හැකියාවක් නැත. මේ කියන බිම්බිසාර රජු ලංකාවේ ජීවත් වූයේ කොහේ ද? එම මගධ රාජ්‍යය තිබුණේ කොහේ ද?

මෙම පුද්ගලයාගේ විග්‍රහයේ තවත් ස්ථානයක මෙසේ තමන්ගේ සෙළුව හෙළිකරයි.

''එදා දේවහෙළයේ උපන් ගෞතම බුදු පියාණන් වහන්සේ දේව හෙළයෙන් පිටත වූ ලංකාපුර රාජධානියට වැඩම කළ අවස්ථා තුනක් මහාවංශයේ සඳහන් වෙයි. මේ ලංකාපුර රාජධානියට පැමිණි අවස්ථා තුනම මහාවංශයේ හා දීපවංශයේ සඳහන් වෙයි. මේ කිසිම අවස්ථාවක ඉන්දියාවේ හෝ වෙනත් සිවු හෙළයන් පිටත පරදේශයක සිට ලංකාපුර රාජධානියට පැමිණි බවක් සඳහන් නො වේ. මිහිඳු හිමියන්ද ලංකාපුර රාජධානියට ධර්මදූත මෙහෙවර සඳහා පැමිණියේ දේවහෙළයේ ජම්බුද්වීපයේ ජීවත් වූ කාලයේදී ය.'' **(සිරිධම්මාලංකාර, 2018:39).**

ගෞතම බුදුරජාණන් වහන්සේ දේව හෙළයක උපන්නේයයි කියමින් මානසික විකෘතියකින් දොඩවන උන්මත්තකයන් රචනා කරන පොත්පත්වලට එක්කො නීතියෙන් දඬුවම් කළ යුතු ය. නැත්නම් විකෘති මානසික තත්වයක් ඇත්තන් මානසික රෝහල්වලට යැවිය යුතු ය.

ඉහත සඳහන් උද්ධෘතයෙන් කියවෙන කිසිවක් මහාවංශයේ නොමැත. එපමණක් නො ව දේවහෙළය නැමති ගමක් හෝ නමක් එහි නොමැත සිද්ධාර්ථ උත්පත්තිය නේපාලයේ ලුම්බිණියේ සිදු වූ බවට සියලු ම විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් ඔප්පු කොට අවසාන ය. අවසන් වරට 2015.11.14 දින ලුම්බිණියේ ජාත්‍යන්තර බෞද්ධසම්මේලනයේ දී ලෝක බෞද්ධයන් හමු වේ අදහස් ඉදිරිපත් කළ මහාචාර්ය කනිංහැම් (ජූනියර්) මහතා ප්‍රකාශකළේ ස්ථිර වශයෙන් ම බුද්ධෝත්පාදය සිදු වූයේ ලුම්බිණියේ ශාලවෘක්ෂය පාමුල බවත් එම සාලවෘක්ෂයේ දිරාගිය මූල පද්ධතිය අවසාන කැණීම් මගින් සොයා සංරක්ෂණය කොට තහවුරු කොට ඇති බවත් ය.

එම ජාත්‍යන්තර සම්මේලනයට මෙම ලිපිය ලියන ලේඛකයා ද සහභාගි වූ බවත් එහි දී සත්‍යාක්ෂණය කළ අදහස් ලෝක පුරාවිද්‍යාවේ විශිෂ්ට සොයාගැනීම් ලෙස ලෝක පුරාවිද්‍යා ඉතිහාසයට එකතු වන බවත් සඳහන් කළ හැකි ය. මෙහි දී ශ්‍රී ලංකාවක් හෝ දේවහෙළයක් හෝ වෙනත් බහුබූතයක් සඳහන් නො වූ බවත් සඳහන් කරනු කැමැත්තෙමි. එහෙයින් මෙවැනි සම්පප්‍රලාප දොඩවන මානසික රෝගීන් මානසික රෝහල්වලට යැවිය යුතු බවට සඳහන් කරනු කැමැත්තෙමි.

තවද නේපාලයේ ලුම්බිණියට සැතපුම් 40ක් පමණ දකුණට වන්නට කකුසඳ බුදුරදුන්ගේ උපන් ගම්මානයේ ධර්මාශෝක රජතුමා සිට වූ සෙල්ලිපියක් දක්නට ලැබෙන අතර එම සෙල්ලිපිය මුස්ලිම් අන්තවාදීන් විසින් කැබලි දෙකකට කඩා ඇතත්, පසු ව එය වඩා හොඳින් සංරක්ෂණය කොට ආරක්ෂා සහිතව තබා තිබේ.

එතැන් සිට සැතපුම් 20 පමණ වයඹට පැරණි පොකුණක් මැද කෝණාගමන බුදුන් වහන්සේ උපන් ගම්මානය පිහිටා තිබෙන අතර එය 1905 දී ඉතාලි පුරාවිද්‍යාඥයන් පිරිසක් විසින් ධර්මාශෝක රජතුමා කරවූ ටැම් ලිපියක් කියවීමෙන් සනාථ කොටගෙන තිබේ.

තවමත් කාශ්‍යප බුදුන් වහන්සේගේ උපන් ස්ථානය ඉන්දියානු පුරාවිද්‍යාඥයන් විසින් සොයාගෙන නොමැත. මේ සියලු ම බුදුවරුන් බුදු වී ඇත්තේ ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ වූ නේපාලයේ ය. බුදුන් වහන්සේ පිරිනිවන් පා වසර 249කට පසු ධර්මාශෝක අධිරාජයා බුදුන් වහන්සේගේ උත්පත්තිය සිදු වූ ස්ථානයට ගොස් රජුගේ ගෞරව පුදකොට "ශ්‍රේෂ්ඨ ආගමික නායකයා උපන් ස්ථානය යයි" සඳහන් ශිලා ලිපිය පිහිටවනු ලැබූ අතර, ලුම්බිණි ග්‍රාමයේ සිද්ධාර්ථ උත්පත්තිය සිදු වූ ස්ථානයේ පිහිට වූ ටැම්සෙල්ලිපියේ "මිනිසුන්ගෙන් අයබදු අය නො කරන ලෙස" බ්‍රාහ්මීය අක්ෂරවලින් හා පාලි අක්ෂරවලින් සඳහන් කොට තිබේ. මෙම ස්ථානය 1967 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් ඌතාන් මහතා විසින් ලුම්බිණි සංවර්ධන පදනම ආරම්භ කරනු ලැබූ අතර 1994 වර්ෂයේ දී ලුම්බිණිය යුනෙස්කෝව UNESCO මගින් ලෝක උරුම නගරයක් බවට පත්කරනු ලැබී ය. මුලු ලොව ම පිළිගත් විද්‍යාත්මක සාක්ෂි තිබියදී ශ්‍රී ලංකාව වැනි උගත් බෞද්ධයන් සිටින රටක 21 වන සියවසේ දී ඉතිහාසය නො දන්නා අමනයනගේ සංස්කෘතියක් නිර්මාණය වීම පුදුම සහගත ය.

මෙම නව සංස්කෘතිය පිළිබඳ ව බොහෝ දේ සාකච්ඡා කිරීමට ඇත් ද එය කාලය කා දැමීමක් ලෙස සලකමි. එයට හේතුව ඔප්පු කළ හා ලෝකය පිළිගත් යථාර්ථයක් පිළිබඳ ව නැවත නැවත කරුණු දැක්වීම නිශ්ඵල ක්‍රියාවක් වන හෙයිනි. අවසාන වශයෙන් යමක් ප්‍රකාශ කළ යුතු ය. එනම් බටහිර ලෝකයේ බොහෝ ආගම් ප්‍රතික්ෂේප වන විට, උපතේ සිට මහා පරිනිර්වාණය දක්වා සියලු තොරතුරු පුරාවිද්‍යාත්මක සාක්ෂි මත ඔප්පු වී තිබෙන එක ම ශාස්තෘන් වහන්සේ බුදුන් වහන්සේ ය. එ මෙන් ම උන් වහන්සේගේ සියලු දේශනා අනුපිළිවෙළින් සූත්‍ර, විනය හා අභිධර්මය ක්‍රමානුකූල ව සංග්‍රහකොට තිබේ. මේ නිසා බටහිර ලෝකය වේගයෙන් ලෝක යථාර්ථය ග්‍රහණය කිරීම සඳහා බුදු දහම වැළඳගනිමින් සිටින අවධියක මිනිසුන්ගේ මනසට බුදුන් වහන්සේ පිළිබඳවත් උන් වහන්සේ දේශිත ධර්මය පිළිබඳවත් අවිනිශ්චිතතාවය ඇතුළත් කිරීමට වලිකන NGO නඩයේ මූල්‍යමය ප්‍රතිලාභ ලැබූ, වේගයෙන් පුන්නක්කු රසවිඳී ගොන්නාම්බන්ගේ තප්පුලැම ඉවසීමෙන්, මෙම මාධ්‍ය සංස්කෘතික යුගයේ බලාසිටින්නට හැකිවනු ඇත. එය තුළ දක්නට ඇත්තේ "කිරිපිරි බුරුළු තිබිය දී එළදෙන අඟ ගෙන කිරිදෝනා අඥානයන් පිරි ලෝකයක් මේ සියවසේ නිර්මාණය වී ඇති බව යි.

ශ්‍රී ලංකාවේ නව ලිබරල්වාදී චින්තනය හඳුන්වා දීම හා සමාජ ව්‍යූහයේ නව තත්ව සංකේත ලබාගැනීමට කෙරෙන පෙලඹවීම.

1977න් පසු විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික හා දේශපාලනික හා සංස්කෘතික පද්ධතීන් උඩුයටිකුරු වන්නට විය. මෙය

සාම්ප්‍රදායික බෞද්ධ ආගමික මධ්‍යස්ථානවලට මෙන් ම ගිහි සමාජයට ද එකසේ බලපෑවේ ය. ලෝකයේ සමාජ ස්ථරායනය පිළිබඳ ව හඳාරන විට අසමානතාව නිසා නිර්මාණය වන්නා වූ ආත්මීය හා වාස්තවික මානයන් තුනක් දක්නට ලැබේ. **(Webes, 1968:120).** මුදල්, ඉඩකඩම්, දේපළ, යානවාහන ආදි වාස්ථවික දේවල් පදනම් කොටගෙන නිර්මාණය වන්නාවූ පන්තිය (Class) පුද්ගලයාගේ උපතට හිමි ගෞරවය, අධ්‍යාපනයට, රැකියාවට හිමි ගෞරවය ආදියෙන් නිර්මාණය වන්නා වූ සමාජ ගරුත්වය (Social Status) මෙය බොහෝවිට ආත්මීය මානයකි.

එමෙන් ම දේශපාලන පක්ෂවල තනතුරු දැරීම දේශපාලනයේ නියැළීම, ආදිය නිසා ඇතිවන්නා වූ දේශපාලන බලය (Poitical Power)මෙම ස්ථරායනයෙන් පංතිය (Class), තත්වය (Status), n,h (Power) යන මානයන් එකිනෙක වෙනස්වන අතර අනෝන්‍ය වශයෙන් හුවමාරු කළ හැකි ය. උදාහරණ වශයෙන් ගතහොත් ආර්ථික වශයෙන් වත්කම්, උපයාගත් පුද්ගලයා අනිවාර්යයෙන් ම සමාජ තත්වය ලබා ගැනීමට උත්සාහ දරයි. එමෙන් ම සමාජ පන්තිය හා තත්වය ලබාගත් පුද්ගලයා අනිවාර්යයෙන් ම අන්‍යයන් පාලනය කිරීමට දේශපාලන බලය ලබාගැනීමට උත්සාහ කරයි. මෙය අනිත් අතට ද සිදු වේ. දේශපාලන බලය ලබාගත් පුද්ගලයා ගරුත්වය හා ආර්ථික වශයෙන් ඉහළ පන්තියකට ළඟාවීමට උත්සාහ කරයි.

මෙම සමාජ ස්ථරායනයේ ඇති වූ වෙනස් වීම 1977න් පසු ආර්ථිකය විවෘත වීමත් සමඟ නව ධනවත් පන්තියක් ඇති විය. මේ අය අතරට මන්ත්‍රීවරුන්, ස්වාමීන් වහන්සේලා, ව්‍යාපාරිකයන් ආදි බොහෝ අය අයත් වූහ. ආර්ථික වශයෙන් බලවත් වූ මේ අයට සමාජීය වශයෙන් ගෞරවය ලබා ගැනීමට තිබූ කෙටි ම මාර්ගය වූයේ විශ්වවිද්‍යාලය අධ්‍යයන මණ්ඩලවල සුදුසුකමක් වූ ආචාර්ය උපාධියක් (P.hD) නමේ මුලට හෝ අගට යොදා ගැනීම යි. ආචාර්ය උපාධියක් යනු සංවිධානාත්මක දැනුම පිළිබඳ සංකේතයකි. ආචාර්ය උපාධියක් යනු විශිෂ්ට ගණයේ පුහුණුවකි. ආචාර්ය උපාධියක් යනු ශික්ෂණයකි. මේ ත්‍රිවිධ අංගයන් එක්වූ විට සමාජයේ ගෞරවනීය නායකත්වයට සුදුසු, සාමාජය මෙහෙයවන පුද්ගලයෙක් වන්නේ ය. මේ කිසිවක් නැති නුපුහුණු, අ.පො.ස. සාමාන්‍ය පෙළවත් නොමැති දේශපාලන පුස්සන් සහ අශීලාචාර ක්‍රියාමාර්ගවලින් ධනය උපයාගත් ධනවතුන් තමන්ගේ නම බැබළවීම සඳහා යෝග්‍ය තත්ව සංකේතයක් ලෙස P.hD ලබාගැනීමට උත්සුක වූහ. එක්තරා ආකාරයකට මෙය කළු සල්ලි සුදු කිරීමකි.

මේ සමඟ සමාජයේ ඉල්ලීම සපුරාලීම සඳහා ආචාර්ය උපාධි සපයන ආයතන ලංකාව පුරා ම මෙන් ම විදේශ රටවල ද ඇතිවන්නට විය. ඔවුන් නානාප්‍රකාර වර්ණවත් උපාධි ලෝගුවලින් විනිර්මුක්ත ව පුවත්පත්වල දැන්වීම් පළකිරීම සඳහා ගෞරවාන්විත තත්ව සංකේතයක් ලබා ගැනීමට නව පොහොසත් පන්තිය **(New rich)** උනන්දු වීම 21 වන සියවසේ ප්‍රධාන ලක්ෂණයක් බවට පත් වී තිබේ.

මේ ආකාරයට ගරුත්ව සංකේත ඉපයීමේ මෙහෙයුමකට ශ්‍රී ලංකාවේ චීවරධාරීන් කොටසක් ද එක් වූහ. සමහර විට පාරාජිකාවට පත් ව නඩුහබවලින්

වැරදිකරුවන් වූ උසාවිවලින් දඬුවම් ලැබූ මේ පුද්ගලයන් ස්වකීය ජීවිතය පුරා ම පැතුරුණු කළු ගරුත්ව සංකේතය, සුදු ගරුත්ව සංකේතයක් බවට පත්කර ගැනීමට රාජ රාජ මහාමාත්‍ය ප්‍රභූන් පූජා කළ සංස්කෘතික දේපළවල ශක්තිය සහ ඉපයූ ධනයේ ශක්තිය මේ සඳහා යොදා ගත්හ. සමහර විට අතිශය ගෞරවණීය සේවයක් ඉටුකළ ධර්මධර, විනයධර මහා ස්වාමීන් වහන්සේලා පවා මෙම ආචාර්ය උපාධිය (P.hD) ලබාගෙන ස්වකීය ගෞරව නාමය ලබා ගැනීමට ක්‍රියාකළ ආකාරය මෙම වාණිජ සංස්කෘතියේ ප්‍රකට ලක්ෂණයක් වන්නට විය. සමහර ගිහියන් ස්වකීය තත්ව සංකේතය සඟවා තබා ගනිමින් ප්‍රසිද්ධ විශ්වවිද්‍යාලයවල අධ්‍යයන මණ්ඩලවල සාමාජිකත්වය හෙබවීමට පවා යොදාගත්හ.

## සෝවාන් කරවීමේ වැඩමුළු සහ "ගෞරව සංකේත"

බුදුන් වහන්සේ දෙසූ දහමේ, පංච නීවරණ තුරන් කරමින් ගමන් කරන නිර්වාණගාමී පටිපදාවේ ප්‍රථම මාර්ගඵලය "සෝවාන් ඵලයයි". මෙය පුද්ගලයා විසින් පමණක් ම අවබෝධ කරගත යුතු දෙයකි. නමුත් 21 අගභාගය වන විට සෝවාන් කරවීමේ සංස්කෘතියක් නිර්මාණය වී තිබේ. මෙය ක්‍රියාත්මක වන්නේ මුදල් ඇති ප්‍රභූපන්තියට පමණි. සෝවාන් වීමෙන් අනතුරු ව මුදල් ගෙවා ඔවුන් ලබන සහතිකය තමන්ගේ නිවසේ හෝ වෙනත් ස්ථානයක ප්‍රදර්ශනය කළ හැකි ය. මෙම ක්‍රියාවලිය මෙම සියවසේ ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය තුළ දක්නට ලැබෙන බරපතල විහිළුව යි. මේ පිළිබඳ ව එක්කො ශාසනයේ භාරකාරයන් හෝ රටේ භාරකාරයන් වගකිව යුතු ය.

විවෘත ආර්ථිකයට පින් සිදුවන්නට අයථා ක්‍රියාමාර්ගවලින් මුදල් උපයාගත් අගනුවර ප්‍රභූ කාන්තාවන් විසින් හසුරවන NGO කාරයන්ගේ පුද පූජාවට ලක්වන මෙ වැනි ක්‍රියාවන් වර්තමානයේ ශ්‍රී ලාංකික බෞද්ධ සංස්කෘතියේ ඛේදනීය පිළිලයෝ වෙති.

## හුණුපිටියේ ගංගාරාමයේ නවම් පෙරහැර සංස්කෘතිය සහ නව වානිජ ප්‍රභූපන්තිය

කොළඹ නගරයේ පිහිටි බොහෝ පන්සල් අතර හුණුපිටියේ ගංගාරාමයට හිමි වන්නේ ඉතාමත් වැදගත් ස්ථානයකි. බෞද්ධ දරුවන්ට ධර්ම ශාස්ත්‍රිය ඥානය ලබා දීම, කාක්ෂණික පුහුණු ආයතනයක් වශයෙන් ක්‍රියා කිරීම, වෘත්තීය අධ්‍යාපනය සඳහා දරුවන් යොමු කිරීම හා රැකියා ලබා දීමට කටයුතු කිරීම, ගංගාරාමයේ මහා පිරිවෙණ මගින් ස්වාමීන් වහන්සේලා දහස් ගණනින් විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය සඳහා යොමු කරන අතර ගම්මානවලින් පැමිණෙන බොහෝ දුප්පත් දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදෙමින් ඔවුන්ගේ ජීවිත උසස් තත්වයට පත් කිරීම මෙන් ම දරුවන්ට පරිගණක අධ්‍යාපනය මෙන් ම ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීම ආදී බොහෝ කාර්යභාරයන් ඉටු කරන පන්සලකි. ජාත්‍යන්තර වශයෙන් ඉතාමත් කීර්තියක් අත්පත් කර දෙන මෙම ගංගාරාමය සංචාරකයන්ගේ නිබඳ ආකර්ශනට ලක් වූ බෞද්ධ කේන්ද්‍රස්ථානයක් විය. එ මෙන් ම අගනුවර දේශපාලඥයන් නිරන්තරයෙන් ම ගැවසෙන ස්ථානයක් බවට ද පත් විය.

1977න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ බෝහෝ ආර්ථික, සාමාජික, සංස්කෘතික වෙනස් වීම් සමග කොළඹ නගරයෙන් විශාල පරිමාණ ව්‍යාපාරික පිරිස් බිහිවන්නට විය. ආර්ථික වශයෙන් ආඪ්‍ය වූ මෙම පිරිස් වැඩි වශයෙන් ගංගාරාමයේ දායකයන් වූවා පමණක් නො ව ඔවුන් දේශපාලන ප්‍රභූ පිරිසක් වශයෙන් ද ක්‍රියා කරන්නට වූහ. මෙම දේශපාලන ප්‍රභූන් අතර මැදකොළඹ මන්ත්‍රීවරයා වූ ආර්. ප්‍රේමදාස මහතා සුවිශේෂ පුද්ගලයෙක් විය. මෙම සම්බන්ධතා ජාලය තුළ ප්‍රධාන ප්‍රභූ පිරිස් තුනක් ක්‍රියාත්මක විය. එනම් ආර්ථික ප්‍රභූන්, දේශපාලන ප්‍රභූන්, සහ ගංගාරාමයේ අනන්‍යතාව හෙබ වූ මහා සංඝරත්නය නියෝජනය කළ සංස්කෘතික ප්‍රභූන් යන තුන් කොට්ඨාශය යි. මෙම තුන් කොට්ඨාශය ම ඒකීය සංස්කෘතියකට ගෙන එමින් නව පෙරහැර සංස්කෘතියක් 197 පෙබරවාරි මාසයේ දී බිහි විය. මෙය ගංගාරාමයේ නවම් පෙරහැර සංස්කෘතිය යි. එවකට මැදකොළඹ මහජන මන්ත්‍රීවරයා වූ ආර්. ප්‍රේමදාස මහතාගේ දේශපාලන නායකත්වය ඇති ව නව ආරම්භයක් සනිටුහන් කරමින් නවම් පෙරහැර ක්‍රියාත්මක වන අතර සැරියුත් මුගලන් අග්‍රශ්‍රාවකයන් වහන්සේලාට ශ්‍රාවක පදවි පිරිනැමීම පදනම් කොටගෙන ක්‍රියාත්මක වන මෙම පෙරහැර ශ්‍රී ලංකාවේ සතර කොණ සිටින සියලු ම කලාකරුවන්ගේ අනුග්‍රහයෙන් විශාල අලි සංඛ්‍යාවකින් සමන්විතව උඩරට, පහතරට, සහ සබරගමු යන නර්තන සම්ප්‍රදායවල කලාකරුවන් මෙම පෙරහැරට සම්බන්ධ වේ. අන්‍ය පෙරහැරවලට සාපේක්ෂ ව මහා සංඝරත්නය ද පෙරහැරේ වැඩමකරන අතර මෙහි සුවිශේෂම සිද්ධිය වන්නේ බස්නායක නිලමේවරු විශාල සංඛ්‍යාවක් මුල් ඇඳුම් ඇඳ පෙරහැරේ ගමන් කිරීම යි. "2013 වන විට ගංගාරාම පෙරහැරට කලාකරුවන් පන්දහසකට අධික පිරිසක් සහභාගි වේ. පන්සියයක් පමණ මහා සඟරුවනද පෙරහැරේ වැඩම කරති." **(ආටිගල, 2015:70).**

ඉහත සඳහන් සාකච්ඡාවට අනුව පැහැදිලි වන දෙයක් නම්, පූජ්‍ය දෙවින්දර ශ්‍රී වාචිස්සර හිමිපාණන් ආරම්භ කළ ගංගාරාමයේ පෙරහැර සාමාන්‍ය පෙරහැරක් බවට ක්‍රියාත්මක වුව ද, පසු කාලීන ව නව ප්‍රබෝධයක් සහිත ව ආරම්භ වන්නේ 1979 වර්ෂයේ නව විවෘත ආර්ථිකයේ ප්‍රතිඵල ද සහිත ව ය. මෙහි දේශපාලන නායකත්වය ප්‍රමුඛ වූ අතර එම දේශපාලන නායකත්වය පිටුපස සිටින මැදකොළඹ වාණිජ ප්‍රභූපිරිස පෙරහැර ඔසවාගෙන යන මූල්‍යමය දායකත්වය දරනු ලැබී ය. මෙම ප්‍රභූවරුන් බොහෝ දෙනෙකු සාම්ප්‍රදායික වැඩවසම් රදළ පන්තියට අයත් නො වී ය. එමෙන් ම සුවිශේෂ දේවාලයවල බස්නායක නිලමේවරු ද නො වූහ. එහෙත් මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපාරික පන්තිය වූ අතර ඔවුන්ට සමාජ ගෞරවය ලබා දෙන පරිදි වාර්ෂික පෙරහර සංවිධානය විය.

මෙම පෙරහැරේ ආර්ථික ප්‍රභූ පිරිසට සමාජ ගෞරවය ලැබෙන ප්‍රධාන උපක්‍රමය වූයේ සාම්ප්‍රදායික මුල් ඇඳුම කේන්ද්‍රකරගත් සිංහල නිල ඇඳුම්වල ගෞරවනීය ස්වභාවය යි. බොහෝ විට පැරණි පරම්පරාවල රාජකීය තුප්පොට්ටිය සැට්ටය නිලමේවරුන්ගේ තොප්පිවලින් සමන්විත ව ගෞරවාන්විත ව මුතු කුඩ යට මෙම බස්නායක නිලමේවරු ගමන් කළෝ ය. 750 පමණ ප්‍රභූ පිරිසක් මෙසේ ගමන් කිරීම කිසියම් ගාම්භීරත්වයක් ප්‍රකට කළ අතර ම එවැනි ලක්ෂණ ඇති එක ම පෙරහැර වූයේ ද මෙය යි. විශේෂයෙන් ම සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගත්

මෙම පෙරහැර මහනුවර ඇසළ මහා පෙරහැරට ද අභියෝගයක් ලෙස ඉදිරිපත් වූවක් වශයෙන් ද සැලකිය හැකි ය. ලෝකයේ බොහෝ කාලයක් තිස්සේ නො කඩවා පැවති දළදා සංස්කෘතිය හා සබැඳි ඇසළ පෙරහැර මංගල්‍යය සාම්ප්‍රදායික වූ අතර එය එම පෙරහැර වර්ගයේ පරමාදර්ශී පෙරහැරක් විය. එහෙත් එම පෙරහැරේ අන්තර්ගත සෞන්දර්යාත්මක අංග බොහෝමයක් සමඟ නව වානිජ පන්තියේ අවශ්‍යතා සඳහා ම නිපද වූ මෙම පෙරහැර සංස්කෘතිය ද අපගේ බෞද්ධ සංස්කෘතියට මෑතක කාලයේ එක් වූ සුවිශේෂ අංගයකි.

## නිගමනය

ලෝකයේ ක්‍රියාත්මක වන විවිධ ආකාරයේ බෞද්ධ සංස්කෘතීන් දක්නට ලැබේ. මෙය මහායාන මෙන් ම හීනයානයේ ද සුලබ දර්ශනයකි. සමහර බෞද්ධ සංස්කෘතික නිර්මාණයෝ ඉබේ නිර්මාණය වූ ඒවා නො වෙති. බටහිර දේවවාදී ආගම් සහිත නිකායන්ට අභියෝග වන ඕනෑම ආගමක් විනාශ කිරීම ඔවුන්ගේ පරම අභිලාෂය යි. පසුගිය අවුරුදු 1000 ඇතුළත මෙම ක්‍රියාවලිය වඩාත් වේගවත් වූයේ යටත්විජිතකරණයට සම්බන්ධ මිෂනාරි අධ්‍යාපනයත් සමඟ ය. ශ්‍රී ලංකාවේ ද අවම වශයෙන් බටහිර මිෂනාරි ආගමික රාජ්‍ය නො වන සංවිධාන දහස් ගණනක් ක්‍රියාත්මක වන ආකාරයක් දක්නට ලැබේ. සමහර මිෂනාරි ආගමික සංවිධාන ඍජු ලෙස ආගම්වලට ප්‍රහාර එල්ල නො කරන අතර ආගමික සංස්කෘතියට කිඳාබැස එම සංස්කෘතිය විකෘති කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ මෙම ආගමික සංවිධාන බොහොමයක් මිනිසුන් තුළ අවිනිශ්චිතතාව ප්‍රවර්ධනය කිරීමට NGO මගින් මුදල් යොදවති. මෙම සංස්කෘතික ආක්‍රමණය ආසියානු අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල ද දක්නට ලැබේ. මෙම සංස්කෘතික විකෘර්තීකරණයෙන් සමාජයේ කේන්ද්‍රීය සාරධර්ම පද්ධතියට අතිමහත් බලපෑමක් ඇති කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය


ආටිගල,අසංග, 2015 **පෙරහැර විත්ති**, වරකාපොළ: හෙළදිව ප්‍රකාශකයෝ.

බලගල්ලේ, විමල්, ජී. 1995 **"අෂ්ටායතන හෙවත් අටමුල"**, අපේ සංස්කෘතික උරුමය, කොළඹ: සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

ධම්මාලංකාර, මීවනපලාන, 2018 **බලන් කඩතුර හැර දෑසේ**, කොළඹ: කොට්ටාව මෙවන්සා ග්‍රැෆික්ස් ඇන්ඩ් ප්‍රින්ටර්ස්

වාචිස්සර, කොටගම, 1960 **සරණංකර සංඝරාජ සමය**, කොළඹ: වයි. දොන් ඇඩ්වින් පුත්‍ර සමාගම.

විමලානන්ද, තෙන්නකෝන්, 1999 (සංස්) **ලංකාවේ පනස් වසක්**, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත, වැලිවිටියේ. 1911 **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය**,කොළඹ : ගොඩගේ සහ පුත්‍රයෝ.

Tambaiah, S.J. 1970 **Buddhism and the spirct cults in Northeast Thailand**, Cambrdge: University Press.

Webes, Max, 1968 **Economy & Sonely**, New York : Bedminster Press.

Webes, Max, 1961 **From Max Webes** (eds) London : H. W. Girth & C. White Mills.